# කාව්‍ය විචාර ග්‍රන්ථයක් වශයෙන් සියබස්ලකරේ වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක්

ආර්.එම්. සරෝජණී සෙව්වන්දි රූපසිංහ[1]

## හැඳින්වීම

සිංහලයේ හමුවන පැරණිම කාව්‍ය විචාර ග්‍රන්ථය වන්නේ සියබස්ලකරයි. මෙය "සියබස්+ලකර" යන වචන ද්වයෙන් නිර්මාණය විය.මෙහි "සියබස" යන්නෙන් අර්ථ ගැන්වෙන්නේ සිංහල භාෂාවයි. "ලකර" යන්නෙන් සංස්කෘතයෙහි දැක්වෙන්නේ "අලංකාර" යන පදයයි. සංස්කෘත ආලංකාරිකයන්ගේ අදහස ට අනුව කාව්‍ය ශෝභාව උපදවන ධර්මතා කාව්‍යාලංකාර වේ. අලංකාර මුල් කොට ගනිමින් අලංකාරවාදය නම් විචාර වාදයක් පැන නැගුණු සේම රස, ධ්වනි ආදී කාව්‍යාංග මුල් කොට ගනිමින් ද විචාරවාද පැන නැගී තිබේ.මේ සියලු විචාර වාද අලංකාර ශාස්ත්‍රය නම් පුළුල් විෂයට ඇතුළත් වෙයි. ඒ අනුව සිංහල භාෂාවේ අලංකාර විග්‍රහ කර ඇත්තේ සංස්කෘත විචාරකයන් අනුව යමින් බව මේ පිළිබඳ වැඩිදුර අධ්‍යනයේ දී පසක් වෙයි.සියබසෙහි අලංකාර පිළිබඳව විග්‍රහ කරන කෘතිය යන මැයෙන් නිර්මිත සියබස්ලකරෙහි කතුවරයා ලෙස විද්වත් ගෞරවයට පාත්‍ර වන්නේ පළමුවන සේන රජතුමාය.මෙතුමා සංස්කෘත නොදත් අයගේ සහ කෙටියෙන් පැවැති පැරණි අලංකාර ග්‍රන්ථ නොදත් අයගේ ප්‍රයෝජනය සඳහාත්, පරාභිවෘද්ධිය සැලැස්වීම සඳහාත් මෙන් ම අමරගිරි කුසුබුතුමන් විසින් කරන ලද පෙළඹවීමත් නිමිති කොටගෙන දණ්ඩීන්ගේ "කාව්‍යාදර්ශය" සිංහලයට පරිවර්තනය කර ඇත. සැබැවින් ම එතුමා සංස්කෘත ආලංකාරික දණ්ඩීන්ගේ නිර්මාණය පදානුපදිකව සිංහලයට පරිවර්තනය නොකර, උචිතානුචිත භාවයෙන් යුක්තව අනවශ්‍ය දෑ ඉවත් කරමින්, අවශ්‍ය දෑ එකතු කරමින් සියබස්ලකර රචනා කළේය. දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය මෙන් ම පළමුවන සේන රජතුමාගේ සියබස්ලකර ද සර්ග තුනකින් යුක්තවන අතර ඊට අයත් මුළු ගී ගණන හාරසිය අටකි. පළමු සර්ගය ගී හැට හතකින් යුක්තවන අතර එහි කාව්‍ය ලක්ෂණ, කාව්‍ය ප්‍රභේද, රචනා ක්‍රම, මහාකාව්‍ය ලක්ෂණ, ප්‍රාණ හෙවත් කාව්‍ය ගුණ මෙන් ම කාව්‍ය හේතු යනාදී කරුණු අන්තර්ගත වෙයි. ද්විතීය සර්ගයේ කාව්‍යාදර්ශයේ ආ අර්ථාලංකාර තිස් පහ පිළිබඳ ව දක්වන අතර එය ගී දෙසිය හැත්තෑ දෙකකින් යුක්ත වෙයි. තෘතීය සර්ගයේ දී යමක නම් ශබ්දාලංකාරය, කාව්‍ය දෝෂ, දෘශ්‍යාර්ථ (-) ගම්‍යාර්ථ යන අර්ථ භේදය, කර්තෘගේ ප්‍රාර්ථනය හා කර්තෘ සන්දර්ශනය යන කරුණු ගී හැට නවයකින් ගෙන හැර දක්වයි. ඒ අනුව විධිමත් සිංහල සාහිත්‍ය වංශයක ඇරඹුම සනිටුහන් කරන අනුරාධපුර සාහිත්‍ය යුගයේ රචනා කෙරුණු සියබස්ලකර එදා මෙදාතුර කාව්‍ය ක්ෂේත්‍රයට නවමු ආලෝකයක් සැපයීය. මෙයින් කාව්‍යකරණයේ ආධුනිකයන්ට අවශ්‍ය මග පෙන්වීම නොපිරිහෙලා ඉටු කෙරෙන අතර කාව්‍ය විචාරයේ නියැලෙන්නන්ට අවශ්‍ය මගපෙන්වීම ද සියබස්ලකරින් ඉටුවිණි. ඒ අනුව මෙම පර්යේෂණය තුළින් කාව්‍ය විචාර ග්‍රන්ථයක් වශයෙන් සියබස්ලකරේ

1. සිංහල අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය. saro78roopasinghe@gmail.com

වැදගත්කම පිළිබඳ අධ්‍යනය කෙරෙයි. කාව්‍ය විචාර ග්‍රන්ථයක් ලෙස සියබස්ලකර රචනා වීමෙන් පසු වර්තමානය වන විටත් කාව්‍ය විචාරය සඳහා එවැනි මගපෙන්වීමක් සිදු කරන ග්‍රන්ථයක් නිර්මාණය නොවීමට හේතු සාධක විමසීම ද මෙම පර්යේෂණය තුළින් අරමුණු කෙරෙයි. ඒ අනුව මෙම පර්යේෂණය තුළින් නූතන කාව්‍ය විචාරකයින් සියබස්ලකර මූලාශ්‍රය කරගැනීමට පොළඹවමින්, වඩා සාර්ථක කාව්‍ය විචාරයන් ඉදිරිපත් කිරීමට අවධානය යොමු කරවීමද අපේක්ෂා කෙරෙයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙහි දී ප්‍රධාන වශයෙන් ද්විතීයික දත්ත යොදා ගනිමින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිතයට ගැනේ. ඒ අනුව සියබස්ලකර විවරණ පිළිබඳ වත්, සංස්කෘත කාව්‍ය විචාර සිද්ධාන්ත පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කරමින් පර්යේෂණයට අදාළ දත්ත රැස් කර ඇත.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

සියබස්ලකර වූ කලී අලංකාර ශාස්ත්‍රයට පිවිසීමට කැමති පාඨකයෙකුට ඒ පිළිබඳ ව අවබෝධයක් ගත හැකි අත් පොතකි. මුල් කෘතිය හෙවත් දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය තුළ අන්තර්ගත ඇතැම් කරුණු ඒ ආකාරයෙන් ම සිංහලයට නගා ඇත. එමෙන් ම කාව්‍යාදර්ශයේ ඇතුළත් වූ ඇතැම් කරුණු මුළුමනින් ම අතහැර දමා ඇති අතර සියබස්ලකර සහ දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය තව දුරටත් අධ්‍යනය කිරීමේ දී පැහැදිලි වන්නේ කාව්‍යාදර්ශයේ සඳහන් ඇතැම් කරුණු සංශෝධනය කර සියබස්ලකරෙහි අන්තර්ගත කර ඇති බව මෙන් ම මුල් කෘතියේ අන්තර්ගත නොවන කරුණු ද සියබස්ලකරකරුවා සිය අභිමතය පරිදි තම ග්‍රන්ථය තුළ අන්තර්ගත කර ඇති බව යි. සියබස්ලකර අධ්‍යනයේදී තවත් ඉස්මතු වී පෙනෙන කරුණක් වන්නේ මෙය අලංකාර සම්ප්‍රදාය පමණක් ම විග්‍රහ කරන කෘතියක් නොවන බව යි. මන්ද යත් සියබස්ලකරේ ඇතැම් තැනක සිංහල භාෂාව සතු අනන්‍ය ලක්ෂණ ද විග්‍රහ කෙරෙයි. සියබස්ලකර රචනා වී සියවස් ගණනාවක් ගතවුව ද අදත් කාව්‍යකරණයේ මෙන් ම කාව්‍ය විචාරයේ නියැලෙන්නන්ට ගුරු කොට ගත හැකි ග්‍රන්ථයක් ලෙස හැඳින්විය හැකි ය. සියබස්ලකර ආරම්භයේ දී ම කතුවරයා කවියේ අන්තර්ගතය පිළිබඳව විග්‍රහයක යෙදෙන අතරම අනතුරුව කවියේ අරටුව බඳු වූ විරිත් පිළිබඳ විග්‍රහයක යෙදෙයි. ඒ අනුව දඹදෙණි සාහිත්‍ය යුගයේ විරචිත එළු සඳැස් ලකුණට පෙරාතුව විරිත් ශාස්ත්‍රය පිළිබඳ ආලෝකයක් සපයන්නේ සියබස්ලකරයි. තව ද සිංහල කවියේ අන්තර්ගතය පිළිබඳ උපදෙසක් ලබා දීමට සියබස්ලකරකරුවා අමතක කොට නැත. විධිමත් සාහිත්‍යයක ආරම්භකම අවධියේ එසේ මාර්ගෝපදේශයක් ලබා දීමත්, එය කවියන් හිස් මුදුනින් ම පිළිගත් ආකාරයත් මැනැවින් ගම්‍යමාන වන්නේ සියබස්ලකර රචනාවීමෙන් පසුව ගම්පොල සාහිත්‍ය යුගය තෙක්ම සියබස්ලකර කතුවරයාගේ උපදෙසට අනුව ම පද්‍ය රචනා වූ හෙයිනි. තව ද සියබස්ලකර රචනා වූ අනුරාධපුර සාහිත්‍ය යුගයේ සිංහල සාහිත්‍යයට මහාකාව්‍ය දායාද වී නොතිබුණ ද, අනාගතයේ ඇතැම් දවසක කාව්‍යකරණයේ නියැලෙන්නට මහාකාව්‍ය රචනා කිරීමට අදාළ මග පෙන්වීමක් සියබස්ලකර තුළින් සිදුකර ඇත. ඒ ආභාසයෙන් පසු කලෙක කාව්‍යශේඛරය, කව්සිළුමිණ වැනි වූ මහාකාව්‍ය ද සාහිත්‍යට දායාද විය. තව ද කාව්‍ය විචාරයෙහිලා විශේෂ අවධානයක් යොමු කරන සියබස්ලකර

කතුවරයා අලංකාර පිළිබඳ විශේෂ අවධානයක් ලබා දී ඒ පිළිබඳ ව දීර්ඝ පැහැදිලි විග්‍රහයක යෙදෙයි. මෙය කාව්‍ය විචාරයෙහිලා සියබස්ලකර කතුවරයා සිදුකළ සුවිශේෂී ම මෙහෙවරයි.

**නිගමනය**

අනුරාධපුර සාහිත්‍ය යුගයෙන් ආරම්භ වුණු සිංහල සාහිත්‍ය වංශය එතැන් සිට විවිධ යුග වල දී ගද්‍ය, පද්‍ය ආදියෙන් මනාව සුපෝෂණය විය. දඹදෙණිය, ගම්පොල සහ කෝට්ටේ ආදී වූ සාහිතය යුගයන්හි දී විවිධ පද්‍ය නිර්මාණ බිහිවුණු අතර ඒවා එකකට එකක් දෙවැනි නොවන තරමේ විශිෂ්ට නිර්මාණ විය. එම පසුකාලීන යුගයන්හි දී එවැනි විශිෂ්ට ගණයේ පද්‍ය නිර්මාණ බිහිවීමට මුල් පදනම අනුරාධපුර සාහිත්‍ය යුගයේ දී සියබස්ලකර කතුවරයා සකස් කළ බව නොරහසකි. බුද්ධ චරිතය වස්තු විෂය කරගනිමින් පද්‍ය නිර්මාණය කිරීමත්, කාව්‍යශේඛරය, කව්සිළුමිණ ආදී වූ මහාකාව්‍ය රචනා වීමත් එකී යුගයන්වල මැනැවින් සිදුවිය. එමෙන් ම කාව්‍යකරණයේ දී මෙන් ම යම් කිසි පද්‍යයක් විචාරයේ දී ඒ සඳහා භාවිතයට ගැනෙන සිද්ධාන්ත පිළිබඳ ව ද ආධුනිකයන්ට වඩාත් පැහැදිලි මනා අවබෝධයක් සියබස්ලකර තුළින් ලබා ගත හැකි අතර කාව්‍ය විචාරයේ ප්‍රවීණයන්ට තම දැනුම වඩ වඩාත් තහවුරු කරගැනීමට ද මෙය මහගු පිටුවහලක් වනු නො අනුමානය.

**මුඛ්‍ය පද:** කාව්‍යාදර්ශය, කාව්‍ය විචාර , දණ්ඩීන්, සියබස්ලකර

**ආශ්‍රිත ග්‍රන්ථ**

ධර්ම කීර්ති හිමි, තලකිරියාගම (1969). *කාව්‍යාලංකාරය*, කැලණිය: දීපා මුද්‍රණාලය.

ධර්මාරාම හිමි, රත්මලානේ (2009). *කාව්‍යාදර්ශය*. කොළඹ 10: ගොඩගේ.

විජේවර්ධන ජී. හේමපාල (1967). *සංස්කෘත කාව්‍ය විචාරයේ මූලධර්ම*. කොළඹ 10: ගුණසේන

සම්පත්, බිහේෂ් ඉන්දික (2004). *ඡන්දෝලංකාරා*. කොළඹ 10: ගොඩගේ.

සම්පත්, බිහේෂ් ඉන්දික (2016). *සියබස්ලකර අර්ථදීපනී*. නුගේගොඩ: සරසවි.